මගේ අංකය - JSC/SEC/CIR-L/2025

සියලුම අධිකරණ නිලධාරීන් වෙත,

<u>අධිකරණ මඟින් වෛද්‍ය වාර්තා ආදිය කැඳවීම සඳහා වෛද්‍යවරුන්ට ලිපි නිකුත් කිරීම.</u>

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත් කර ඇති 2001.12.19 දිනැති අංක 270 දරන අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛය සියලුම අධිකරණ නිලධාරීන් වෙත නැවත නිකුත් කරන ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව මා හට නියම කර ඇත.

02. ඒ අනුව, එහි සඳහන් කරුණු පිළිබඳව නැවත ඔබගේ අවධානය යොමු කරන ලෙස මෙයින් දන්වමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 සැප්තැම්බර් මස 10 වෙනි දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

0 -1- 2002

මගේ අංකය: ජේ.444

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 270

සියලුම අධිකරණ නිලධාරීන් වෙත.

අධිකරණ මගින් වෛද්‍ය වාර්තා ආදිය කැඳවීම සඳහා
වෛද්‍යවරුන්ට ලිපි නිකුත් කිරීම

අධිකරණ මගින් වෛද්‍ය වාර්තා ආදිය කැඳවීම සඳහා වෛද්‍ය නිලධාරීන්ට ලිපි නිකුත් කිරීමේදී අධිකරණය මගින් අපේක්ෂා කරනු ලබන්නේ කුමන කරුණක් අරභයා වූ වෛද්‍ය වාර්තාවක්ද යන්න සඳහන් කර නොමැති වීමත්, වෛද්‍ය නිලධාරීන් අපහසුතාවයට පත්වන බව සහ නඩු කටයුතු ප්‍රමාද වීම සිදු වන අවස්ථා ගැන අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත.

02. ඒ අනුව එවැනි ලිපි නිකුත් කිරීමේදී පහත සඳහන් පියවර අනුගමනය කරන ලෙස ඔබට දැන්වීමට අධිකරණ සේවා කොමිෂන් සභාව මට නියම කොට ඇත.

I. වෛද්‍යවරයාගෙන් වාර්තාවක් අවශ්‍ය වන්නේ කුමන කරුණක් සම්බන්ධයෙන්ද යන්න හෝ වෛද්‍ය නිලධාරියාගේ අවධානයට යොමු කිරීම සුදුසුයයි හැඟෙන, අධිකරණය ඉදිරියේ විවාදයට භාජනය වී ඇති කරුණු හැකිතාක් දුරට පැහැදිලිව හා නිශ්චිතව ලිපියේ සඳහන් කළ යුතුය. සැකකරුවන් ආදී තැනැත්තන් වෛද්‍යවරයාට ඉදිරිපත් කර වාර්තාවක් කැඳවන ලෙස පමණක් ලිපියේ සඳහන් කිරීමෙන් අධිකරණයට නියත වශයෙන්ම දැන ගැනීමට අවශ්‍ය වන කරුණු වෛද්‍ය වාර්තාවේ සඳහන් නොවීමට ඉඩ ඇති නිසා, එකී වාර්තා කැඳවීම නිෂ්ඵල ක්‍රියාවක් විය හැකි වන අතර ඒ සඳහා ගතවන කාලය අපතේ යාමක්ද සිදු වේ.

II. හැකිතාක් දුරට වෛද්‍යවරුන්ට යොමුකරනු ලබන එකී ලිපි යතුරු ලියනය කර ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොවන අවස්ථාවේදී පැහැදිලි අකුරෙන් කියවීමට පහසු පරිදි සකස් කොට, දිනය යොදා තිබිය යුතුය.

III. වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කිරීමට යම් නිශ්චිත කාලසීමාවක් නියම කරන්නේ නම් එම කාලසීමාව අවස්ථානුකූල පරිදි අධිකරණය කල්පනා කරන සාධාරණ කාලසීමාවක් විය යුතුය.

IV. රාජකාරි ලිපි ගනුදෙනු වලට අදාල රීතීන්ට යටත්ව, ප්‍රස්තුත කාරණය විනීතව සහ අදහස් පැහැදිලිව ප්‍රකාශ වන පරිදි යොමු කළ යුතුය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

2001 දෙසැම්බර් මස 19 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

පිටපත: ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය.

නිජ/